# සුළු වැරැදිකරුවන් ආගමික පසුබිමක විශෝධනයට

(ජයන්ත සමරකෝන්)

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය ප්‍රජා විශෝධන සේවාව විධිමත් කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

ඒ අනුව, සුළු වැරදි සඳහා අධිකරණයේ ප්‍රජා සේවා දඬුවම් ලබන්නන් ආගමික පසුබිමක් මධ්‍යයේ විශෝධනයට ලක් කෙරේ.

සුළු වැරදිකරුවන් වෙනුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රජා විශෝධන මධ්‍යස්ථාන හතරක් පිහිටුවීමට අධිකරණ අමාත්‍යාංශය පියවර ගෙන තිබේ.

මාලිගාවත්ත ශ්‍රී සුදර්ශනාරාමය, මාලිගාවත්ත සිත්ති විනයාගර් කෝවිල, දැනට ඒ සඳහා තෝරා ගෙන ඇති අතර, කිතුනු හා මුස්ලිම් දේවස්ථාන ඉදිරියේ දී නම් කෙරෙනු ඇත.

විශෝධනයට ලක් කෙරෙන සුළු වැරදිකරුවන් රටේ සංවර්ධනයට දායක කර ගැනීම එම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ බව එම අමාත්‍යාංශය පවසයි.

මාලිගාවත්ත විහාරස්ථානයේ ආරම්භ කරන ලද ප්‍රජා විශෝධන මධ්‍යස්ථානයට ප්‍රජා විශෝධන ආඥාව ලැබූ විසි දෙනකු ඇතුළත් කෙරිණි.

කොළඹ මාලිගාවත්ත විහාරස්ථානයේ ආරම්භ කරන ලද ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය ඉකුත්දා අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා නිරීක්ෂණය කළ අයුරු. ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ලලිත පී. අන්ද්‍රාහැන්නදි, අමාත්‍යාංශ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් කේ.ඩබ්ලිව්. තෙන්නකෝන් යන මහත්වරු ඇතුළු ප්‍රජා විශෝධන නිලධාරීහු ද එක්ව සිටිති.

